# ආර්ථික අභියෝග දිනන හැටි ජනපති අපේක්ෂකයන් ප්‍රතිපත්ති ප්‍රකාශවලින් කියන්න ඕනෑ

## මිලින්ද මොරගොඩ නිවේදනයකින් කියයි

වර්තමානයේ මේ රට මුහුණපා තිබෙන ආර්ථික අභියෝගවලට විසඳුම් කුමක්දැයි මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයින් සිය ප්‍රතිපත්ති ප්‍රකාශන මගින් පැහැදිලි කළ යුතු යැයි හිටපු අමාත්‍යවරයකු වන මිලින්ද මොරගොඩ මහතා පවසයි.

නිවේදනයක් නිකුත් කරමින් ඒ බව පවසන මොරගොඩ මහතා එම නිවේදනයේ මෙසේ ද සඳහන් කර තිබේ.

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ ඡන්ද පදනම ඉලක්ක කරගනිමින් අපේක්ෂකයන්ට සහාය දක්වන්නන් හා ආර්ථික ප්‍රකාශකයන් හැබෑ තීරණාත්මක කාරණා යටපත් කරමින් යථාර්ථවාදී නොවන සහ පදනමක් නැති පොරොන්දු දෙමින් සිටින අතර අවශ්‍ය නම් හඳෙන් හාල් ගෙන එන බවට පොරොන්දු දුන් අතීතයක් අපට ඇති බව ශ්‍රී ලාංකික පුරවැසියන් අමතක කළ යුතු නැත.

වෙනුවෙන් වැය කෙරේ.

5. ශ්‍රීලන්කන් ගුවන් සේවය, ලංකා ඛණිජ තෙල් සංස්ථාව හා ලංකා විදුලිය බලමණ්ඩලය ඩයිනසෝර් යුගයේ පවතින අතර මහජන මුදල් නාස්ති කරමින් සිටී. සොයා බැලීමක් නැති, අකාර්යක්ෂම හා වියදම් සහගත ව්‍යවසාය ආර්ථික අර්බුදය ඇතිකරන්නට හේතු වී තිබේ. ජනතා අභිලාශයන් සාක්ෂාත් නොකරන ව්‍යවසාය වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යයි. මෙරට රාජ්‍ය ව්‍යවසායන්හි කළ යුතු ඉතා වැදගත් ප්‍රතිසංස්කරණ කිරීමට දේශපාලන නායකයන්ට